සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවProvincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 09 ශ්‍රේණිය - 2024
## Second Term Test - Grade 09 - 2024

## බුද්ධ ධර්මය

කාලය පැය 02 යි

නම / විභාග අංකය:

සැලකිය යුතුයි
- පළමු කොටසේ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. එක් ප්‍රශ්නයකට ලකුණු දෙක බැගින් හිමි වේ.
- දෙවන කොටසේ පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

---

### I කොටස

- අංක 01 සිට 10 දක්වා ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. බුදුරදුන් වැඩ සිටිය දී පැවිදිව රහත් වූ අන්තිම රහත් ශ්‍රාවකයා වූයේ.
    1. රාහුල හිමියන් ය.
    2. සුභද්‍ර හිමියන් ය.
    3. ආනන්ද හිමියන් ය.
    4. ඡන්න හිමියන් ය.

02. මාර දූවරුන්ගේ රංගනය සහ මාගන්දියගේ සරාගී ක්‍රියාකාරකම් අබියස විරාගික වීම තුළින් ප්‍රකට වන්නේ බුදුරජාණන් වහන්සේගේ,
    1. සමානාත්මතා ගුණය යි.
    2. කාරුණික ගුණය යි.
    3. චරිතවත් බව යි.
    4. අසරණ සරණ ගුණය යි.

03. සංඝ රත්නය ලොවට දායාද වන්නේ බුදුරජාණන් වහන්සේ සම්බුද්ධත්වයට පත්ව,
    1. දෙමසකිනි.
    2. තෙමසකිනි.
    3. සය මසකිනි.
    4. දස මසකිනි.

04. ශාරීරික, පාරිභෝගික සහ උද්දේසික යන නම් වලින් හඳුන්වන්නේ,
    1. තුන්තරා බෝධිය යි.
    2. ත්‍රිවිධ චෛත්‍යය යි.
    3. ත්‍රිශික්ෂාව යි.
    4. ත්‍රිවිද්‍යා යි.

05. ප්‍රජාපතී ගෝතමී දේවිය සියතින් ම සළු දෙකක් සකස් කොට බුදුහිමියන්ට පිළිගැන්වීමට සූදානම් වූ විට බුදුරදුන් අනුදැන වදාළේ එම සළු,
    1. අනඳ තෙරුන්ට පිළිගන්වන ලෙස යි.
    2. සැරියුත් තෙරුන්ට පිළිගන්වන ලෙස යි.
    3. මහා කාශ්‍යප තෙරුන්ට පිළිගන්වන ලෙස යි.
    4. සංඝයාට පූජා කරන ලෙස යි.

06. සිගාලෝවාද සූත්‍රයේ සඳහන් පරිදි ගිහියා විසින් පැවිදි උතුමන් කෙරෙහි ඉටු කළ යුතු යුතුකමකි,
    1. යහපත් ක්‍රියාවල යෙදවීම.
    2. සුගතියට මග කියා දීම.
    3. වැරදි ක්‍රියාවලින් වළක්වා ගැනීම.
    4. මෛත්‍රී සහගතව කථා කිරීම.

07. සීල ශික්ෂාවට අයත් මාර්ග අංගයක් නොවන්නේ මින් කුමක් ද?

1. සම්මා වාචා
2. සම්මා කම්මන්ත
3. සම්මා වායාම
4. සම්මා ආජීව

08. ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ දක්ෂිණ ශාඛාව ලක්දිවට වැඩම කළේ,

1. මිහිඳු මහ රහතන් වහන්සේ විසිනි.
2. හේමමාලා කුමරිය සහ දන්ත කුමරුන් විසිනි.
3. අනුලා තෙරණිය විසිනි.
4. සංඝමිත්තා තෙරණිය විසිනි.

09. බොහෝ දෑ කැමති වීම බුදු දහමෙහි හැඳින්වෙන්නේ,

1. සන්තුස්සකෝ ලෙස ය.
2. මහිච්ඡතාව ලෙස ය.
3. සුභරෝ ලෙස ය.
4. අප්පකිච්චෝ ලෙස ය.

10. හේතු ප්‍රත්‍ය ඇති කල ඇතිවන නැති කල නැතිවෙන අනිත්‍ය වූ, දුක් සහිත වූ, අනාත්ම වූ සියල්ල හැඳින්වීමට යොදා ගත හැකි වඩාත් සුදුසු ම යෙදුම වන්නේ,

1. සංස්කාර යන්න යි.
2. ලෝකපාලක ධර්ම යන්න යි.
3. අෂ්ටලෝක ධර්ම යන්න යි.
4. පංච නීවරණ ධර්ම යන්න යි.

- **අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියන්න.**

**(වාපි/මුගලන්/ජාත්‍යන්තර/කුසල්/නින්දා)**

11. ........................................ කම්කරු ප්‍රඥප්තීන්ට අනුව පැය අටක වැඩමුරය සේවකයාගේ අයිතිවාසිකමකි.

12. නුවණැත්තා .................................... ප්‍රශංසා දෙකෙහි ම නොසෙල් වී කටයුතු කරයි.

13. බෞද්ධ සංස්කෘතිය සහ ................................... සංස්කෘතිය අතර ඇත්තේ සමීප සබඳතාවකි.

14. සම්මා සමාධිය යනු .................................. අරමුණක සිත එකඟ වීම ය.

15. ...................................... මහ රහතන් වහන්සේ බුදු සසුනෙහි සෘද්ධිමතුන් අතර අග්‍ර වූ සේක.

- **අංක 16 සිට 20 දක්වා දී ඇති ප්‍රකාශය හරි නම් ( √ ) ලකුණ ද වැරදි නම් ( X ) ලකුණද ඉදිරියේ දී ඇති වරහන තුළ යොදන්න.**

16. අන් අයගේ දියුණුව දැක සතුටු වීම උපේක්ෂාව යි. (    )

17. අපාය යනු 'පිරිහීම', 'සැප නැති තැන' යන අර්ථ දෙන පදයකි. (    )

18. බුදුරජාණන් වහන්සේ කර්මය පිළිබඳව දේශනා කළේ සුභ මානවකයාට ය. (    )

19. මාපියන් හෝ අන් ඥාතියෙකු කරන යහපතට වැඩි යහපතක් සුමඟට යෙදූ සිත නිසා සිදු වන්නේ ය. (    )

20. භික්ෂුවක් උපසම්පදා වී අවුරුදු සියයක් ගත වුව ද, එදින ම උපසම්පදා වූ භික්ෂුණියක් දැක හුනස්නෙන් නැගිටිය යුතු ය. (    )

(ලකුණු 2 X 20 = 40)

## II කොටස

**සැළකිය යුතුයි**

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**
- **පළමුවන ප්‍රශ්නයට ලකුණු 20 ක් ද, 02 සිට 07 දක්වා ප්‍රශ්නවලට ලකුණු 10 බැගින් ද හිමි වේ.**

---

01. කෙටි පිළිතුරු සපයන්න.

i. බුදු සිරිතෙන් පිළිබිඹු වන විශිෂ්ට ලක්ෂණ **දෙකක්** ලියන්න.

ii. සංඝ රත්නය අඤ්ජලිකරණීය ලෙස හඳුන්වන්නේ කුමක් නිසා ද?

iii. "සිරිමත් බඹ සිරසෙහි පා පිසිනා ......" කවිය ඇතුළත් වන්නේ කුමන ග්‍රන්ථයේ ද?

iv. භද්දකච්චානා තෙරණියට බුදු සසුනේ ලැබුණු අග තනතුර කුමක් ද?

v. චතු අප්පමඤ්ඤා හඳුන්වන වෙනත් නමක් ලියන්න.

vi. අත්තූපනායික ධර්ම පර්යාය යනු කුමක් ද?

vii. සිව්වනක් පිරිස නම් කරන්න.

viii. අටලෝ දහමට අයත් කරුණුවලින් **දෙකක්** ලියන්න.

ix. පංච නීවරණ ධර්ම අතුරෙන් **දෙකක්** ලියන්න.

x. බුදු දහමට අනුව කුසල මුල තුනකි. ඉන් **දෙකක්** දක්වන්න. (ලකුණු 2 x 10 = 20)

02. i. අටමස්ථානයට අයත් ස්ථාන **දෙකක්** නම් කරන්න. (ලකුණු 02)

ii. සොළොස්මස්ථාන අතුරෙන් **තුනක්** නම් කර ආගමික වැදගත්කම ලියන්න. (ලකුණු 03)

iii. වන්දනාකරුවන් විසින් අනුගමනය කළ යුතු සිරිත් විරිත් **පහක්** ලියන්න. (ලකුණු 05)

03. i. 'සුකරානි අසාධූනි ....' මෙම ධම්මපද ගාථාව සම්පූර්ණ කරන්න. (ලකුණු 02)

ii. එම ගාථාවේ අර්ථය ලියන්න. (ලකුණු 03)

iii. ඔබගේ ජීවිතය නිවැරදිව පවත්වාගෙන යාම සඳහා මෙම ගාථාවෙන් ලබා දෙන උපදෙස් විස්තර කරන්න. (ලකුණු 05)

04. i. බලංගොඩ ආනන්ද මෛත්‍රේය නාහිමිපාණන් වහන්සේ විසින් සංස්කාරක ධූරය දැරූ පුවත්පත කුමක් ද? (ලකුණු 02)

ii. මහානායක හිමියන්ට ලැබුණු ගෞරව නාම **තුනක්** ලියන්න. (ලකුණු 03)

iii. මහ නාහිමිපාණන් වහන්සේගේ චරිතයෙන් ඔබට ගත හැකි ආදර්ශ **පහක්** ලියන්න. (ලකුණු 05)

05. i. චතුරාර්ය සත්‍යයට අයත් අංග **දෙකක්** නම් කරන්න. (ලකුණු 02)

ii. තෘෂ්ණාවේ ප්‍රභේද **තුන** ලියන්න. (ලකුණු 03)

iii. නිවන පරම සැපයක් ලෙස හැඳින්වීමට හේතු පැහැදිලි කරන්න. (ලකුණු 05)

06. i. බුදුරජාණන් වහන්සේ පෙන්වා දුන් අත්හළ යුතු අන්ත **දෙක** නම් කරන්න. (ලකුණු 02)

ii. සතර සතිපට්ඨානයට අයත් කරුණුවලින් **තුනක්** ලියන්න. (ලකුණු 03)

iii. මැදුම් පිළිවෙත අනුගමනය කිරීමෙන් ශිෂ්‍යයන් ලෙස ඔබට සැලසෙන යහපත පෙන්වා දෙන්න.(ලකුණු 05)

07. පහත සඳහන් මාතෘකා අතුරෙන් දෙකකට පමණක් කෙටි සටහන් ලියන්න.

i. මහා ප්‍රජාපතී ගෝතමී තෙරණිය

ii. ආනාපානසති භාවනාව

iii. සේව්‍ය සේවක යුතුකම්

iv. වැවයි දැගැබයි ගමයි පන්සලයි (ලකුණු 05 x 02 = 10)